දිවි තොර කරගැනීමක් හෝ ඊට තැත් කිරීමක් යනු සරලව නොගත යුතු සමාජ සෞඛ්‍ය ගැටළුවකි. එසේ වුවත්, නිසි මැදිහත් වීම් ඔස්සේ එම සමාජ සෞඛ්‍ය ගැටළුව අවම කරගත හැකි බවද ලෝක සෞඛ්‍ය සංවිධානය පවසයි. ඒ සඳහා ගත යුතු එක් පියවරක් ලෙසින්, දිවි තොර කරගැනීම් පිළිබඳ පුවත් වාර්තා කිරීමේදී මාධ්‍ය මාර්ගෝපදේශයන් නිසි ලෙසින් පිළිපැදීම පෙන්වා දිය හැක.

මෙයට උදාහරණ ලෙස, අප්‍රේල් 04, 2022 දින බගවන්තලාව ප්‍රදේශයේ එක්දරු පියෙකු දිවි තොර කරගැනීමට උත්සාහ ගත් පුවත විවිධ මාධ්‍ය ඔස්සේ වාර්තා වූ ආකාරය පෙන්වා දිය හැක.

1) මෙම පුවත් වාර්තාවන් හි සිරස්තලය තුළ දිවි තොර කරගැනීමට උත්සාහ ගත් ආකාරය සඳහන් කර ඇත. රටේ පවතින ආර්ථික අර්බුදයට එම සිදුවීමේ ඇති සම්බන්ධය සැලකූ විට, එසේ දිවි තොර කරගැනීමට උත්සාහ ගත් ආකාරය සඳහන් කිරීම මගින් අනුකාරක දිවි තොර කරගැනීම් සඳහා පෙළැඹවීම් ඇතිවීමේ අවදානමක් තිබේ.

2) මෙම පුවත් වාර්තාවන් හා උපකාරක අංක සඳහන් වී නැත. සමාජය තුළ අද වන විට පවත්නා ආර්ථික අර්බුදය හා පීඩනකාරී තත්ත්වය හමුවේ, මෙවැනි පුවත් වාර්තාවන් සමගින් හදිසි උපකාරක අංක සඳහන් කිරීම වෙන කවරදාකටත් වඩා වැදගත් වේ. එය දිවි තොර කරගැනීමේ නැඹුරුවකින් යුතු තවත් ජීවිතය බේරාගැනීමට ඉඩ සළසනු ඇත.

මේ මොහොතේ වඩාත් වගකීම් සහගත මාධ්‍යකරණය වන්නේ ද එය නොවේද? ඔබේ අදහස?

(මෙම පුවත එදින සහෝදර ඉංග්‍රීසි පුවත්පත් තුළ වාර්තා වී නොතිබුණි)

හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

මූලාශ්‍ර:

[https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...](https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...)
[https://media.samaritans.org/.../Media_Guidelines_FINAL.pdf](https://media.samaritans.org/.../Media_Guidelines_FINAL.pdf)